ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நில அளவைத் திணைக்களம்
SURVEY DEPARTMENT OF SRI LANKA

මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය - දියතලාව
அளவையியல் படமாக்கல் நிறுவனம் - தியத்தலாவை
INSTITUTE OF SURVEYING & MAPPING - DIYATALAWA


| ඔබේ අංකය / உமது இல. / Your No. | මගේ අංකය / எனது இல. / My No. | දිනය / திகதி / Date |
|---|---|---|
| | අයි/ශි/7/2026/QC/10 | 2026.05.05 |

කළමනාකරු,

.......................................................

.......................................................

.......................................................

<u>**2026 වර්ෂය සඳහා අවශ්‍ය ටෝනර් සහ කාට්‍රිජ් මිල දී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම**</u>

2026 වර්ෂය සඳහා මෙම ආයතනයට අවශ්‍ය ටෝනර් හා කාට්‍රිජ් මිල දී ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

02. ඒ සඳහා ඔබ ආයතනයේ මිල ගණන්, මේ සමඟ සපයා ඇති ආකෘති පත්‍රයෙහි සඳහන් කර ඇති පරිදි සියලු විස්තර සහිතව නිවැරදිව සම්පූර්ණ කර, **අත්සන සහ නිල මුද්‍රාව** සමඟ මා වෙත ලැබීමට සලස්වන මෙන් ඉල්ලා සිටිමි. <u>මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී **Original** භාණ්ඩ සඳහා පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතු වේ.</u>

03. මිල ගණන් කැඳවා ඇති ටෝනර් සහ කාට්‍රිජ් මාදිලි අලෙවිය සඳහා අදාල නිෂ්පාදන ආයතන විසින් බලයලත් නියෝජිත ආයතනයක් වශයෙන් ඔබ වෙත ලබා දී ඇති බලය පැවරීමේ ලිපි ඇත්නම්, එම ලිපිවල පිටපත් ද ඔබගේ මිල ගණන්පත හා අමුණා ඉදිරිපත් කළ යුතු ය. අසම්පූර්ණ මිල සැපයීම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඔබ විසින් ඉදිරිපත් කරන මිල ගණන් මාස 03 ක කාලයක් සඳහා වලංගු විය යුතු ය. මෙම භාණ්ඩ මිල දී ගැනීම සඳහා ඔබ ආයතනය තෝරා ගත හොත්, එම භාණ්ඩ මෙම ආයතනය වෙත ගෙනවිත් භාර දිය යුතු ය. මිල ගණන් භාර ගැනීම 2026.05.26 වන දින ප.ව.02.15 න් අවසන් වේ.

04. ඔබ විසින් සපයනු ලබන මිල ගණන් 9" x 4" මුද්‍රා තබන ලද ලිපි කවරයක බහා වම්පස ඉහල කෙළවරේ **"ටෝනර් හා කාට්‍රිජ් මිල දී ගැනීම සඳහා මිල ගණන් - 2026.05.26"** ලෙස <u>අනිවාර්යයෙන්</u> සඳහන් කර සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය, දියතලාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.06.26 වන දින ප.ව.02.15 ට පෙර ලැබෙන සේ හෝ අතින් රැගෙන විත් ආයතනයේ ඇති අදාල ප්‍රසම්පාදන ලිපි පෙට්ටියට බහාලන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

05. ගෙවීම් කටයුතු සිදු කිරීමේ දී අදාල මුද්දර බදු සහ අනෙකුත් බදු සඳහා ඔබ යටත් විය යුතු අතර, මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී මේ සමඟ අමුණා ඇති **දූෂ්‍යසන්ධානීය නොවන බවට** ප්‍රකාශය ද අත්සන් තබා ඉදිරිපත් කළ යුතු ය. 2026.05.26 වන දින ප.ව.02.15 ට මිල ගණන් විවෘත කරන අතර, එම අවස්ථාවට ඔබට හෝ ඔබ විසින් ලිඛිතව බලය පවරන ලද නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

සභාපති
ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය
මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය
දියතලාව.

සභාපති

ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය


| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකථනය (පොදු) | :- +94 - 057 2229001 | தொலைபேசி (பொது) | :- +94 - 057 2229001 | Telephone (General) | :- +94 - 057 2229001 |
| දුරකථනය (අධ්‍යක්ෂ) | :- +94 - 057 2229004 | தொலைபேசி (பணிப்பாளர்) | :- +94 - 057 2229004 | Telephone (Director) | :- +94 - 057 2229004 |
| ෆැක්ස් | :- +94 - 057 2229004 | தொலைநகல | :- +94 - 057 2229004 | Fax | :- +94 - 057 2229004 |
| විද්‍යුත් තැපෑල | :- snrdsgtr@survey.gov.lk | மின்னஞ்சல் | :- snrdsgtr@survey.gov.lk | E-Mail | :- snrdsgtr@survey.gov.lk |

**මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය - දියතලාව**

**අවශ්‍ය ටෝනර් සහ කාට්‍රිජ් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම**

**අවසන් දිනය - 2026.05.26**

නම :- .................................................................................................

ලිපිනය :- .................................................................................................

දුරකථන අංකය :- .................................................................................................

ව්‍යාපාර නාමය :- .................................................................................................

ව්‍යාපාර ලිපිනය :- .................................................................................................

ව්‍යාපාර ලියාපදිංචි අංකය :- .................................................................................................

මිල ගණන් වලංගු වන කාලය ( දින ගණන) :- .................................................................................................

වැට් අංකය (ඇත්නම්) :- .................................................................................................

*** Original භාණ්ඩ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.**

*** මිල ගණන් මාස 03ක් වලංගුවිය යුතුය.**

| අනු අංකය | අයිතම | අවශ්‍ය ප්‍රමාණය | ඒකක මිල (රු.) | සම්පූර්ණ මුදල (රු.) |
|---|---|---|---|---|
| 1 | Toner - Toshiba 2309A | 3 | | |
| 2 | Toner - Toshiba 2329A | 3 | | |
| 3 | Toner - NPG 51 (Canon) | 3 | | |
| 4 | Toner Samsung - 2161(101 S) | 1 | | |
| 5 | Ink – RISO/CV/1200 | 1 | | |
| 6 | Ink Brother (T 220 Printer)Black | 2 | | |
| 7 | Ink Brother (T 220 Printer) Color set | 2 | | |
| 8 | Ink Brother (MFC – J2340DW) Color set | 3 | | |
| 9 | Ink Brother (MFC – J2340DW) Black | 3 | | |
| උප එකතුව | | | | |
| වැට් මුදල | | | | |
| මුළු මුදල | | | | |

ඉහත භාණ්ඩ සැපයීමේ ලංසුව මා වෙත පිරිනමන්නේ නම් මා විසින් ඉහත සඳහන් කර ඇති පිරිවිතර හා මිල ගණන් වලට අනුව භාණ්ඩ සැපයීමට හා ඇණවුම් කළ භාණ්ඩ ගෙනවිත් භාරදීමට එකඟ වෙමි.

ලංසුකරුගේ අත්සන -

මුද්‍රාව (ව්‍යාපාර) -

දිනය -

**<u>මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය - දියතලාව</u>**

**<u>දූස්සන්ධානීය නොවන බවට ප්‍රකාශය</u>**

**(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සඳහා යොමුව - 1.5)**

පහතින් අත්සන් කරනු ලබන ලංසුකරු/ ලංසුකරු නියෝජනය කරනු ලබන්නා/ ලංසුකරුගේ නියෝජිතයා වන මා, අවංකව ද, සත්‍යවාදීව ද, ගාම්භීරතා පූර්වකව ද ප්‍රකාශ කර සිටින්නේ;

(අ) අදාල ලංසු කැඳවීමේ දී, කවරෙකු විසින් හෝ ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සම්බන්ධයෙන් මා විසින් හෝ මා නියෝජනය කරනු ලබන ආයතනයේ/ සමාගමේ/ සංස්ථාවේ/ හවුල්කාරීත්වයේ අන් කවර හෝ සාමාජිකයෙකු, නියෝජිතයෙකු හෝ නියෝජනයකරන්නෙකු විසින් වෙනත් කවර හෝ තැනැත්තෙකු සමඟ කිසිදු සංයෝජනයකට, දූස්සන්ධානයකට හෝ එවැනි ගිවිසුමකට ඇතුළත්ව නොමැති බවත්;

(ආ) මා විසින් හෝ මා නියෝජනය කරන අන් කවරෙකු විසින් හෝ, (ලංසු අංක :..............................) ට අදාලව ලංසු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්, කවරෙකු හෝ ලංසු ඉදිරිපත් කිරීමෙන් වළක්වාලීම හෝ ලංසු ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටීම සඳහා පොළඹවාලීමට ක්‍රියාකර නොමැති බවත්;

(ඇ) මෙම ලංසුව ඉදිරිපත් කරනු ලබන්නේ, අන් කවර හෝ ලංසුවකට අදාලව දූස්සන්ධානීය නොවෙමින් බවත්, එවැනි ලංසුවක් සම්බන්ධයෙන් වෙනත් තැනැත්තෙක් සමඟ වන කවර හෝ ගිවිසුමකින්, අවබෝධයකින් හෝ සංයෝගයකින් හෝ නොවන බවත් ය.

මෙම ලංසුව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කිසිදු පුද්ගලයෙකුගෙන්, සමාගමකින් හෝ සංස්ථාවකින්, ඍජුව හෝ වක්‍රව කිසිදු වට්ටමක්, ගාස්තුවක්, ත්‍යාගයක්, කොමිස් මුදලක් හෝ වටිනා දෙයක් ලබා ගෙන නොමැති බවත් නැතහොත් ලබා නොගන්නා බවත් මම ප්‍රකාශ කර සිටිමි.

මා විසින් තවදුරටත් ප්‍රකාශකර සිටින්නේ, මෙම ලංසුව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කිසිදු පුද්ගලයෙකුට, සමාගමකට හෝ සංස්ථාවකට, ඍජුව හෝ වක්‍රව කිසිදු වට්ටමක්, ගාස්තුවක්, ත්‍යාගයක්, කොමිස් මුදලක් හෝ වටිනා දෙයක් මා විසින් ලබා දී නොමැති බවත්, නැතහොත් ලබා නොදෙනු ඇති බවත් ය.

දූස්සන්ධානීය නොවන බව සහතික කිරීමේ පූර්ණ වගකීම භාරගන්නා මා විසින්, සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ සාධාරණ හා සදාචාරාත්මක තරඟකාරී පරිචයන්ට අනුගතව ක්‍රියාකරන බවටත්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ අදාල ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට සම්පූර්ණයෙන්ම අනුකූලව ක්‍රියාකරන බවටත් පොරොන්දු වෙමි.

ඉහතින් මා විසින් කරන ලද සියලුම ප්‍රකාශයන් සත්‍ය සහ නිවැරදි බවත් මෙයින් ප්‍රකාශ කර සිටී.

..................................................................

ප්‍රකාශකගේ අත්සන